සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................ | ව්‍යාපාර අධ්‍යයනය I | කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. ව්‍යාපාර අධ්‍යයනය විෂයේ දී මූලික සංකල්ප කිහිපයක් අර්ථ දැක්වෙන ආකාරය පහතින් දැක්වේ.
   1. දෙපාර්ශ්වයක් අතර වටිනාකම් හුවමාරු වීම.
   2. වටිනාකමක් ඇති දෙයක් දෙපාර්ශවයක් අතර ගනුදෙනු වීම.
   3. පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමට නිෂ්පාදිතයට ඇති හැකියාව පිළිබඳව පාරිභෝගිකයා මගින් කරනු ලබන ඇස්තමේන්තුව.
   4. පාරිභෝගිකයා අපේක්ෂා කරන ආකාරයට නිෂ්පාදිතය නිර්මාණය කිරීම මඟින් පාරිභෝගිකයා තුළ ඇතිවන මානසික සතුට.
   5. ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් විද්‍යුත් මාධ්‍ය තුළ සම්බන්ධ වන ඕනෑම අවස්ථාවක්. (.........)

   ඉහත අර්ථ දැක්වීම්වලින් ප්‍රකාශ වන මූලික සංකල්ප අනුපිළිවෙලින් සඳහන් ව ඇත්තේ,
   1. භාණ්ඩ හුවමාරුව/වෙළඳම/වටිනාකම/තෘප්තිය/අවකාශ වෙළඳපොල.
   2. හුවමාරුව/වෙළඳම/වටිනාකම/තෘප්තිය/වෙළඳපොළ
   3. හුවමාරුව/ගනුදෙනුව/වටිනාකම/උපයෝගීතාව/ස්ථානීය වෙළඳපොළ
   4. පාරිභෝගිකයා අපේක්ෂා කරන ආකාරයට නිෂ්පාදිතය නිර්මාණය කිරීම මඟින් ගනුදෙනුව / හුවමාරුව / වටිනාකම / තෘප්තිය / අවකාශ වෙළඳ පොළ
   5. ගනුදෙනුව/හුවමාරුව/තෘප්තිය/වටිනාකම/අවකාශ වෙළඳ පොළ (.........)

02. I තීරුවෙහි අවශ්‍යතා කිහිපයක් හා II තීරුවෙහි වුවමනා කිහිපයක් පහත දැක්වේ.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සෞඛ්‍යය | A. බංගලාව |
| 2. ආහාර | B. ප්‍රථමාධාර |
| 3. ඇඳුම් | C. කිරි |
| 4. නිවාස | D. දේශන |
| 5. අධ්‍යාපනය | E. පාවහන් |
| 6. ආරක්ෂාව | F. රක්ෂණය |

I තීරුවෙහි අවශ්‍යතා, II තීරුවෙහි වුවමනා සමඟ නිවැරදිව අනුපිළිවෙළට ගැළපූ විට දැක්වෙන පිළිතුර තෝරන්න.

1. F, C, E, A, D, B    2. B, C, E, A, F ,D    3. B, C, E, A, D, F
4. B, C,E, A, D, F    5. F,C, E, A, B, D (.........)

03. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන් උපුටා ගත් දළ ජාතික නිෂ්පාදිතයට අදාළ දත්ත කිහිපයකි.

| | **රු. දස ලක්ෂ** |
|---|---|
| කෘෂි | 267,404 |
| වන | 15,832 |
| ධීවර | 32,407 |
| පතල් හා කැනීම් | 60,079 |
| නිමැවුම් | 458,660 |
| ඉදිකිරීම් | 177, 912 |
| ප්‍රවාහනය, ගබඩා හා සන්නිවේදනය | 368,653 |

ඉහත තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න. ප්‍රාථමික නිෂ්පාදනයේ වටිනාකම වන්නේ,

1. රුපියල් දස ලක්ෂ 315,643 2. රුපියල් දස ලක්ෂ 375,722 3. රුපියල් දස ලක්ෂ 108, 318
4. රුපියල් දස ලක්ෂ 834,382 5. රුපියල් දස ලක්ෂ 636,572 (.........)

04. පහත දැක්වෙන්නේ නිෂ්පාදන අවස්ථා පැහැදිලි කරන ප්‍රකාශ කිහිපයකි.

A මෛත්‍රීපාල මහතා තම වින්දනය සඳහා දේශීය ඖෂධ වර්ග සහිත ඔසු උයනක් නඩත්තු කරයි. එම ඔසු වර්ග අලෙවි කිරීමේ අපේක්ෂාවක් ඔහුට නැත.

B පත්මා මහත්මිය ඇඳුම් නිර්මාණය සඳහා විශේෂ දක්ෂතාවයක් දක්වන අතර ඇය තම දියණියන් සඳහා නවතම විලාසිතාවන්ගෙන් යුත් ඇඳුම් නිර්මාණය කරයි.

C අසංක සූර්යය ශක්තියෙන්ක්‍රියා කරන පරිගණකයක් නිපදවා ඒ පිළිබඳව පේටන්ට් බලපත්‍රයක් ලබාගෙන සිටී.

D අනූෂා මෙනෙවිය මලින් කරන සැරසිලි සඳහා විශේෂ දක්ෂතාවක් දක්වන අතර, ඇයමංගල හා වෙනත් උත්සව සැරසිලි සඳහා ඇණවුම් භාරගෙන ඒවා ඉටුකරයි.

E විශ්‍රාමික ගුරුවරයෙකු වන ධනූ මහත් තම කාලය වැය කරන්නේසිය වින්දනය සඳහා නිසඳැස් රචනයටයි.

ඉහත ප්‍රකාශ පිළිබඳව නිවැරදිව විස්තර කර ඇති කාණ්ඩය වන්නේ,

1. A සහ E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර B වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
2. A, B, C සහ E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර D වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
3. A,C හා E ඍජු නිෂ්පාදන අවස්ථා වන අතර B සහ D වක්‍ර නිෂ්පාදන අවස්ථාවකි.
4. A, B, C හා E වක්‍ර නිෂ්පාදන අවස්ථා වන අතර D ඍජු නිෂ්පාදන අවස්ථාවකි.
5. ඉහත සියලු ප්‍රකාශනඍජු නිෂ්පාදන අවස්ථා වේ. (.........)

05. භාණ්ඩ හා සසඳන කළ සේවාවක දැකිය හැකි ලක්ෂණ නිවැරදිව දක්වා ඇති කාණ්ඩය තෝරන්න.

1. ස්පශ්‍ය බව/වෙන්ක නොහැකි බව/විවිධත්වය/ගබඩා කළ නොහැකි බව.
2. අස්පෘශ්‍ය බව/වෙන්කළ හැකි බව/ විවිධත්වය/ගබඩා කළ නොහැකි බව
3. අස්පෘශ්‍ය බව/වෙන්කළ නොහැකි බව/ ඒකීය ස්වරූපය/ගබඩා කළ නොහැකි බව
4. අස්පෘශ්‍ය බව/වෙන්කළ නොහැකි බව/විවිධත්වය/ගබඩා කළ නොහැකි බව
5. හිමිකරුවෙකු නොසිටීම/ස්පෘශ්‍ය බව/විවිධත්වය/ගබඩා කළ නොහැකි බව. (.........)

06. රාජ්‍ය ආදායමට අයත් බදු වර්ගකීපයක් පහත දැක්වේ.

A පුද්ගල ආදායම් බදු B නිෂ්පාදන බහු
C ප්‍රාග්ධන ලාභ බදු D එකතු කළ අගය මත බදු
E රේගු බදු F සමාගම් බදු

මින් වක්‍ර බදු වලට අයත් බදු වර්ග ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. A,B,C 2. B,C,E 3. A,B,D 4. B,C,D 5. B,D,E (.........)

07. අන්තර්ජාතික වශයෙන් පිළිගත හැකි පාරිභෝගික අයිතිවාසිකම් අතරින් පාරිභෝගික ජාත්‍යන්තරය ප්‍රකාශයට පත්කරන ලද පාරිභෝගික අයිතිවාසිකම් ඇතුළත් කාණ්ඩය පහත දැක්වෙන පිළිතුරු අතරින් තෝරන්න.
   1. ආරක්ෂාව සලසා ගැනීම, තෝරා ගැනීම, සවන් යොමු කරවා ගැනීම, තෝරා ගැනීම, සවන් යොමු කරවා ගැනීම
   2. තොරතුරු දැනගැනීම, වන්දි ලබා ගැනීම, තෝරාගැනීම, සවන් යොමුකරවා ගැනීම.
   3. මූලික අවශ්‍යතා සපුරා ගැනීම, වන්දි ලබා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය, සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීම.
   4. මූලික අවශ්‍යතා සපුරා ගැනීම, තෝරාගැනීම, පාරිභෝගික අධ්‍යාපනය, සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීම.
   5. ආරක්ෂාව සලසා ගැනීම, මූලික අවශ්‍යතා සපුරා ගැනීම, පාරිභෝගික අධ්‍යාපනය, සවන් යොමුකරවා ගැනීම.
(.........)

08. හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන්මතිබිය යුතු ගුණාංග 3 අඩංගු පිළිතුර වන්නේ,
   1. උපරිම හවුල්කරුවන් 20ක් සිටීම.
   2. ව්‍යාපාර කටයුත්තක් පැවතීම.
   3. පුද්ගලයන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් සිටිය යුතු වීම.
   4. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සඳහා පොලී නොගෙවිය යුතුයි.
   5. අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වයක්පැවතිය යුතුයි.

1. ABC    2. ACD    3. BCD    4. BCE    5. BDE    (.........)

09. පහත සඳහන් වන්නේ ව්‍යාපාර සංවිධාන හා ඒවාට අදාළ උදාහරණ කීපයකි.

| **ව්‍යාපාර සංවිධාන** | **උදාහරණ** |
|---|---|
| A කේවල ස්වාමි ව්‍යාපාර | 1. සීමාසහිත වෙනුර සමාගම |
| B හවුල් ව්‍යාපාර | 2. දිනෙත් ස්ටෝර්ස් |
| C සීමිත පෞද්ගලික සමාගම් | 3. සී/සලිවේරා (පොදු) සමාගම |
| D නිල ලැයිස්තුගත නොවූ පොදු සමාගම් | 4. සහන් සහ සහෝදරයෝ |
| E නිල ලැයිස්තුගත වූ පොදු සමාගම් | 5. සී/ස තරිඳු (පෞද්) සමාගම |

1. A-2, B-3, C-1, D-4, E-5    2. A-5,B-2, C-3, D-5,E-4    3. A-2, B-4, C-5, D-1, E-3
4. A-5, B-1, C-4, D-2, E-3    5. A-2, B-3, C-5, D-1, E-4    (.........)

10. පෞද්ගලික අංශයට අයත් සමාජ සුභසාධනය, අරමුණුකරගත් නීතිමය පුද්ගලබවක්, නොමැති ව්‍යාපාර සංවිධාන අනුපිළිවෙළින් ගැලපූ විට,
   1. කේවල ස්වාමි ව්‍යාපාර/හවුල් ව්‍යාපාර / සීමිත පොදු සමාගම්
   2. හවුල් ව්‍යාපාර / සමුපකාර / දෙපාර්තමේන්තු
   3. හවුල් ව්‍යාපාර / සමුපකාර / රාජ්‍ය සංස්ථා
   4. කේවල ස්වාමි ව්‍යාපාර / රාජ්‍ය සංස්ථා / සීමිතපොදු සමාගම්
   5. සීමිත පෞද්ගලික සමාගම් / හවුල් ව්‍යාපාර / රාජ්‍ය දෙපාර්තමේන්තු    (.........)

11. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රශංසාව යනාදී ප්‍රතිලාභ අපේක්ෂිත ව්‍යවසායකත්වය වන්නේ,
   1. කාන්තා ව්‍යවසායකත්වය    2. සමාජීය ව්‍යවසායකත්වය    3. ගෝලීය ව්‍යවසායකත්වය
   4. අභ්‍යන්තර ව්‍යවසායකත්වය    5. හරිත ව්‍යවසායකත්වය    (.........)

12. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නංවාලීමේ ණය යෝජනා ක්‍රමය (SMILES) සඳහා මුල්‍ය අනුග්‍රහය ලබාදෙන්නේ,
   1. ආසියානු සංවර්ධන බැංකුව    2. අන්තර්ජාතික සහයෝගිතාවසඳහා වූ ජපාන බැංකුව
   3. ෆෙඩ්රික් නිව්මාන් පදනම    4. ලෝක බැංකුව
   5. ජාත්‍යන්තර මුල්‍ය අරමුදල    (.........)

13. බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස සැලකිය හැක්කේ,

1. ඒෂියා සුරැකුම්පත් සමාගම. 2. J.B සෙකියුරිටීස් සමාගම 3. සිංහපුත්‍ර ෆිනෑන්ස් PLC

4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 5. සම්පත් බැංකුව (.........)

14. රේඛනයක් නොමැති සාමාන්‍ය ලෙස ලියනලද චෙක්පතක අඩංගු කරුණක් නොවන්නේ,

1. දිනය 2. චෙක්පත තැන්පත් කරන බැංකුවේ නම 3. අණකරුගේ අත්සන

4. ගෙවිය යුතු මුදල 5. ගෙවනු යන පදය (.........)

15. විද්‍යුත් මුදල් වර්ගයක් නොවන්නේ,

1. ණයපත් 2. හරපත් 3. පෙරගෙවුම් කාඩ්පත් 4. ATM කාඩ්පත් 5. ස්මාර්ට් කාඩ්පත්. (.........)

16. රක්ෂණය කළ නොහැකි අවදානමක් වන්නේ,

1. ජීවිතයක අවදානම. 2. ව්‍යාපාරයක්පාඩු ලැබීමේ අවදානම.

3. ව්‍යාපාර ගොඩනැගිල්ලකට ගින්නෙන් සිදුවන හානි. 4. රථවාහන අනතුරු අවදානම.

5. මාර්ගස්ථ මුදල් වලට සිදුවන හානි. (.........)

17. සාමාන්‍ය රක්ෂණය යටතට අයත් නොවන්නේ,

1. ගිණි රක්ෂණය 2. සොරබිය රක්ෂණය 3. ජීවිත රක්ෂණය

4. වගකීම් රක්ෂණය 5. සමුද්‍රය රක්ෂණය (.........)

18. ප්‍රවාහනය සඳහා යොදාගන්නා ක්‍රම X තීරුවෙන්ද එම ක්‍රමවල වාසි හා අවාසි කීපයක් Y තීරුවේද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. මහා මාර්ග ප්‍රවාහනය | A සෙසු ප්‍රවාහන මාධ්‍ය හා සසඳන කළ ගාස්තු අඩුවීම. |
| 2. දුම්රිය මාර්ග ප්‍රවාහනය | B ප්‍රවාහන පිරිවැය අධික වීම. |
| 3. ගුවන් ප්‍රවාහනය | C වැඩිකාලයක් ගතවීම. |
| 4. ජල ප්‍රවාහනය | D අවශ්‍යතාවට ගැළපෙන සේ මාධ්‍යයක් තෝරාගත හැකිවීම. |

මෙම x හා y තීරු දෙක නිවැරදිව ගැලපූ විට නිවැරදිව පිළිතුර වන්නේ,

1. 1-A, 2-C, 3-B, 4-D 2. 1-D, 2-B, 3-C, 4-A 3. 1-D, 2-A, 3-B, 4-C

4. 1-A, 2-D, 3-B, 4-C 5. 1-D, 2-B, 3-A, 4-C (.........)

19. බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන නියෝජිතයින් වර්ග කීපයක් X තීරුවේද, ඔවුන් සපයනු ලබන සේවාවන් Y තීරුවේද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. කොමිස් නියෝජිතයා | A ගැණුම්කරු, විකුණුම්කරු, සම්මුඛ කර ගනුදෙනු සිදුවීමට අවශ්‍ය තොරතුරු සපයයි |
| 2. තැරැව්කරු/බ්‍රෝකර්ස් | B තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගනී. |
| 3. සාධ්‍යකයා | C ප්‍රධානියා වෙන්වෙන් ණයට භාණ්ඩ විකිණීම සිදුකර, එම මුදල් එකතුකර දීමට කටයුතු කරයි. |
| 4. කැපකරු නියෝජිතයා | D ප්‍රධානියාගේ වෙළෙඳ ගනුදෙණුවලදී එය තම පෞද්ගලික නමින්ම සිදු කරයි. |

මෙම x හා y තීරු දෙක නිවැරදිව ගැලපූ විට නිවැරදිව පිළිතුර වන්නේ,

1. 1-A, 3-D, 3-C, 4-B 2. 1-B, 2-A, 3-D, 4-C 3. 1-D,2-C, 3-B, 4-A

4. 1-C, 2-B, 3-A, 4-D 5. 1-B, 2-D,3-A, 4-C (.........)

20. අපනයනය කන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් එම රටේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලියවිල්ල වන්නේ,

1. හානි රක්ෂණ ලිපිය 2. සනීපාරක්ෂක සහතිකය 3. රක්ෂණ සහතිකය.

4. ප්‍රභවස්ථාන සහතිකය. 5. වෛදිකා කුවිතාන්සිය. (.........)

21. පහත ප්‍රකාශ අතරින් **වැරදි** සහිත ප්‍රකාශය තෝරන්න.
   1. කළමණාකරණ භූමිකාවේ සාර්ථකත්වයට කළමණාකරණ කුසලතා තුනම එකසේ වැදගත් වේ.
   2. සංවිධානයේ සමස්ථ දැක්ම අවබෝධය යනාදියට සංකල්පනාත්මක කුසලතා අග්‍ර කළමණාකරුවකුට වැදගත්වේ.
   3. මානව කුසලතා හැම මට්ටමකට කළමනාකරුවන් ප්‍රගුණකළ යුතුයි.
   4. අග්‍ර කළමනාකරුවන් නිරන්තරයෙන් තාක්ෂණික කුසලතා ප්‍රගුණ කළ යුතුයි.
   5. ආයතනයක මෙහෙයුම් කටයුතු වලට සම්බන්ධ වන පළමු පෙළ කළමණාකරුවන්ට තාක්ෂණික, මනෝභාවාත්මක කුසලතා වලට වඩා තාක්ෂණික කුසලතා වැදගත්වේ. (.........)

22. එක් සුපරික්ෂකයෙකු වෙත එක් සේවකයෙකු පමණක් වගකිව යුතුය යන මූලධර්මය හඳුන්වන්නේ,
   1. සංවිධාන ව්‍යුහය ලෙසයි. 2. පාලන අවකාශය ලෙසයි. 3. මධ්‍යකරණය ලෙසයි.
   4. විමධ්‍යගත කරණය ලෙසයි. 5. අණකිරීමේ ඒකීයතාවය ලෙසයි. (.........)

23. පහත කාර්යන් අතරින් මෙහෙයුම් කළමණාකරණයට පමණක් ඇතුළත්වන්නාවූ කාණ්ඩ ඇතුළත් පිළිතුරු තෝරන්න.
   A. භාණ්ඩ මිල කිරීම. B නිෂ්පාදන ඉංජිනේරුකරණය. C මානව සම්පත් පාලනය.
   D නිෂ්පාදන පාලනය E ද්‍රව්‍ය මිලදී ගැනීම. F විකුණුම් ප්‍රවර්ධනය.
   1. ABC 2. ABD 3. ADE 4. BDE 5. DEF (.........)

24. නිෂ්පාදන ව්‍යාපාරයක් ගබඩා පිරිවැය අඩුකරගැනීමට යොදාගනු ලබන යෝග්‍යක්‍රමය වන්නේ,
   1. තත්ව පාලනය 2. ABC විශ්ලේෂණ ක්‍රමය 3. තොග පාලනය
   4. JIT ක්‍රමය 5. සමච්ඡේදන ලක්ෂ්‍ය විශ්ලේෂණය (.........)

25. පහත වගුවේ X තීරුවේ අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය හා Y තීරුවේ පාරිභෝගික දෘෂ්ටිකෝණයේ අලෙවිකරණ මිශ්‍රය දැක්වේ.

| X | Y |
|---|---|
| A නිෂ්පාදිතය | 1. පහසුව |
| B - මිල | 2. සන්නිවේදනය |
| C ප්‍රවර්ධනය | 3. පාරිභෝගික විසඳුම |
| D ස්ථානය | 4. පිරිවැය |

   ඉහත X තීරුව Y තීරුව නිවැරදිව ගලපා ඇති කාණ්ඩය වන්නේ,
   1. A-1, B-2,C-3,D-4 2. A-2, B-1, C-3, D-4 3. A-2, B-3,C-4, D-1
   4. A-3,B-4, C-2, D-1 5. A-3, B-4,C-1, D-2 (.........)

26. පහත දැක්වෙන අලෙවිකරණයේ ප්‍රතිඵල ඇසුරෙන් පාරිභෝගිකයාට පමණක් වැදගත්වන කාණ්ඩය තේරන්න.
   A. පහසුවෙන් භාණ්ඩ හා සේවා මිලදීගත හැකිවීම. B භාණ්ඩ හා සේවා පරාසය පුළුල් වීම.
   C වෙළෙඳපොල තුළ භාණ්ඩ හා සේවා බහුලවීම. D ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම.
   E වෙළෙඳපොළ පිළිබඳ දැණුම පුළුල්වීම. F අයිතිකරුගේ හා සේවකයන්ගේ තෘප්තිය වර්ධනය වීම.
   1. ACE 2. ABD 3. CDF 4. DEF 5. ABC (.........)

27. සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිතවල එකතුවට වඩා ණය ප්‍රාග්ධනය අඩුනම් එම අනුපාතය හඳුන්වන්නේ,
   1. ජංගම අනුපාතය ලෙසය. 2. ක්ෂණික අනුපාතය ලෙසය.
   3. ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය ලෙසය. 4. අධිතෝලන අනුපාතය ලෙසය.
   5. අවතෝලන අනුපාතය ලෙසය. (.........)

28. පහත සඳහන් භාණ්ඩ අතරින් මූල්‍යන තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
 1. ණය හිමියෝ, කොටස් ප්‍රාග්ධනය, මුදල්, ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ.
 2. ණය හිමියෝ, ලාභාංශ, කොටස් ප්‍රාග්ධනය හා ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ.
 3. ස්ථාවර වත්කම්, මුදල්, වෙළෙඳ බඩු තොග හා ණයගැතියන් පිළිබඳ තීරණ
 4. ණය ගැතියන්, බඩු තොග, මුදල් සහ ගෙවිය යුතු වියදම් පිළිබඳ තීරණ.
 5. කොටස් ප්‍රාග්ධනය, ණය ප්‍රාග්ධනය, ලාභාංශ , ව්‍යාපාරය පුළුල් කිරීමේ තීරණ. (.........)

29. ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග විවිධ පදනම් මත වර්ගකළ හැක.පහත සඳහන් ඒවා අතරින් ඍජු හා අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගයක් වන්නේ,
 1. ණයකර නිකුතුව. 2. කොටස් නිකුතුව 3. රඳවාගත් ලාභය
 4. බැංකු ණය 5. කල් බදුය. (.........)

30. රැකියා විස්තරයක අඩංගු කරුණක් නොවන්නේ,
 1. සේවා කොන්දේසි. 2. සුපරීක්ෂණය 3. වැඩ කළයුතු පැය ගණන
 4. රැකියාවේ ස්වභාවය 5. කායික යෝග්‍යතාව. (.........)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. (අ) ලෝක බැංකුවේ වර්ගීකරණයට අනුව ලොව ව්‍යාපාර/ව්‍යවසාය සංස්කෘතියක ගති ලක්ෂණ වැඩි වශයෙන් ඇති රට ලෙස හඳුන්වනු ලබන්නේ ...................................................................... වේ.
 (ආ) ලෝක පාරිභෝගික ජනතාවගේ අයිතීන් රැක ගැනීමට කටයුතු කරන සංවිධානය .......................... ...................................................................... යන නමින් හඳුන්වනු ලැබේ.

32. (අ) ව්‍යාපාර කටයුතු කෙරෙහි හිතකර හෝ අහිතකර ලෙස බලපෑම් ඇතිකරන මහජන ක්‍රියාකාරීත්වයකින් යුතු කණ්ඩායම් ........................................... කණ්ඩායම් ලෙස හඳුන්වයි.
 (ආ) බුද්ධිගලනය නිසා පුහුණු ශ්‍රමය හිඟය, දේශීය කර්මාන්ත අඩපණ වීම ................................................ නිසා ඇති වී ඇති ............................................................. බලපෑමකි.

33. (අ) වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී ගෙවනුලබන පොලී අනුපාතිකය ............................................. ............................................ වන අතර, රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් ඇතිකරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් ණය ප්‍රමාණය පාලනය කිරීම ........................................................ ............................................................. වේ.
 (ආ) පාරිභෝගික ආරක්ෂණයෙන් ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩුවීම ........................................................................ අත්වනවාසියක් වන අතර, වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂාවීම ....................................................................... අත්වන වාසියක් වේ.

34. (අ) ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ සමාගම් ......................................................... වර්ගයට අයත්වනඅතර එම ව්‍යාපාර සංවිධාන සංස්ථාගත කරනු ලබන පනත වන්නේ ..............................................................දරණ පනතයි.
 (ආ) කොටස් නිකුත් කිරීමක් සිදු නොකරන සාමාජික වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති සමාගම් ....................................................................... සමාගම් වේ.

35. (අ) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා විවිධ වූ දිරිගැන්වීම්ල බාදෙන ආයතන අතරින් NEDA යන කෙටි යෙදුමෙන් හඳුන්වනුලබන ආයතනය ..................................... .......................................................
 (ආ) SLCSMI යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන්නේ ......................................................................... ........................................................ යන ආයතනය වේ.

36. (අ) ඉන්ටර්කොම් අභ්‍යන්තර ............................................... හා ............................................ සන්නිවේදනය මාධ්‍යයක් ලෙස හැඳින්විය හැක.

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ අවසන් අදියර ලෙස ........................................................ දැක්වෙන අතර ඊට පෙර අදියර ලෙස .................................................................................... දැක්වේ.

37. (අ) 'කළමණාකරණයේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් සිදුවීමට ඉඩ ඇති විචල්‍ය නිරීක්ෂණය කරමින් ඒවා ව්‍යාප්ත වීම වැළැක්වීමට කරන පාලනය හඳුන්වන්නේ ..................................................... .............................................. ලෙසයි.

(ආ) ආයතනයක් තුළ සේවකයන්ගෙන් කාර්ය ඉටුකරවා ගැනීමට වැඩි අවධානයක් යොමුකරන නායකත්ව ශෛලිය ................................................................. නම් වන අතර, සේවක සිතුම් පැතුම් හා වුවමනාවන් හඳුනාගනිමින් කාර්ය ඉටුකරගන්නා නායකත්ව ශෛලිය ............................................... ....................................... නමින් හඳුන්වයි.

38. (අ) නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ, ගැනිලි, බලය යනාදී යෙදවුම් එකම ස්ථානයට ගෙන භාවිතා කරන පිරියත ක්‍රමය .................................................... පිරියත ක්‍රමය ලෙස හැඳින්වේ.

(ආ) අවම තොග මට්ටම .................................................. ලෙස හැඳින්වෙන අතර, තොග සම්බන්ධ මුළු පිරිවැය අවම වන පරිදි වරකට ඇනවුම් කළයුතු තොග ඒකක ප්‍රමාණය ................................................................. ලෙසද හඳුන්වයි.

39. (අ) ...................................................................................... හා ............................................................................ යනු සම්බන්ධතා අලෙවිකරණයේ සම්පූර්ණ කිරීමට අත්‍යාවශයෙන් සපුරාලිය යුතු ගුණාංග දෙකකි.

(ආ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ කොටස් දෙකක් ලෙස ....................................................... සහ ............................................................................ හැඳින්විය හැක.

40. (අ) කොටස් වෙළඳපොළෙහි සමස්තයක් වශයෙන් කොටස් මිල ගණන් ඉහළයමින් පවතින තත්ත්වයක්.................................................................... ලෙසත්,

(ආ) මිල ගණන් පහළ යමින් පවතින තත්ත්වයක් ................................................................................... වෙළඳපොල ලෙසත් හැඳින්වේ.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 4ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................
3. ........................................................................ 4. ........................................................................

42. නිෂ්පාදන ක්‍රමය සඳුනිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරුවීමට බලපෑ ප්‍රධාන හේතු හතරක් දක්වන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

43. විද්‍යුත් මුදලින් ගණුදෙනු පියවීමේදී ඊට සම්බන්ධ පාර්ශව 4 සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ........................................................................................................................................

3. ........................................................................................................................................

4. ........................................................................................................................................

44. නැව් කඳ රක්ෂණය යටතේ ලබාගත හැකි ඔප්පු වර්ග 4ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

45. ප්‍රවාහනය ව්‍යාපාරිකයාට වැදගත් වන ආකාර 4ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

46. විදේශ වෙළඳම සඳහා පදනම් වී ඇති සාධක 4ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

47. ව්‍යාපාර ආයතනයක පරමාර්ථ අරමුණු ඉටුකරගැනීමට මනා කළමණාකරණයක් තිබිය යුතුයි. මෙහිදී වර්තමානයේ කළමනාකරුවන් කටයුතු කිරීමේදීඔවුනට මූණපෑමට සිදුවන අභියෝග හෙවත් සීමා 4ක් ලියන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

48. නිෂ්පාදිතයක ජීවන චක්‍රයේ (Product Life Cycle) ප්‍රදාන අධියර පිළිවෙළින් නම් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

49. මුදල් වෙළඳපොළේ උප වෙළෙඳපොළ හතරක් නම් කරන්න

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

50. රැකියා පිරිවිතරයක අඩංගු කරුණු 4ක් සඳහන් කරන්න.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

32 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................  ව්‍යාපාර අධ්‍යයනය II  කාලය පැය තුනයි

- **උපදෙස් :- ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. (i) ''ව්‍යාපාර ලොව නවරැල්ල (The New wave of the business world) විද්‍යුත් ව්‍යාපාරයි''

(අ) 'විද්‍යුත් ව්‍යාපාර' අර්ථ දක්වා එය 'විද්‍යුත් වාණිජ්‍යයෙන්' වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මෑත කාලයේ ලෝකයේ බොහෝ රටවල සාර්ව පරිසරය තුළ දේශගුනික විපර්යාස රාශියක් වාර්තා විය. මිනිසා විසින් සිදුකළ ඉවක් බවක් නැති පරිසර දූෂණය මීට හේතු විය. පරිසර දූෂණය අවම කිරීමට ලෝක ප්‍රජාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) (අ) පුද්ගලයෙකුට නිෂ්පාදිත ලබාගත හැකික්‍රම 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) විද්‍යුත් වාණිජ්‍යය ගනුදෙනුවක ලක්ෂණ 4ක් නම් කරන්න. (ලකුණු 2)

(iii) ව්‍යාපාරයක් මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂා කරන අරමුණු වර්ගකල හැකි විවිධ පාර්ශවයන් 4ක් නම් කර, එම එකිනෙක පාර්ශ්වයන්ගේ අරමුනු 2 බැගින් නම් කරන්න. (ලකුණු 4)

(iv) (අ) භාණ්ඩ හුවාමරු ක්‍රමයේ පැවති ගැටළු 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) 'ව්‍යාපාරවල සමාජ වගකීම පුළුල් දර්ශනයකි' මෙම දර්ශනය තුළ විවිධ පාර්ශ්ව සලකා බැලේ. එම විවිධ පාර්ශව නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) නිෂ්පාදිතය යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) සමාජ වගකීම් ඉටු කිරීමෙන්ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ 4ක් ලියන්න. (ලකුණු 2)

02. (i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදනවල ගුණත්වය තහවුරු කිරිම සඳහා ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී ඔහු විසින් සැලකිල්ලට ගතයුතු සාධක හතරක් සඳහන් කර එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) ව්‍යාපාර රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට විවිධාකාරයෙන් දායකත්වය ලබාදේ. එසේ දායකවන ක්‍රම 4ක් සඳහන්කරන්න. (ලකුණු 2)

(ආ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරයනිදසුන් 2ක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේදී අතීතයටත් වඩා අවශ්‍ය වී තිබේ. ඊට බලපා ඇති හේතු 4ක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයක් වන්නේ ප්‍රමිති ක්‍රියාත්මක කිරීමයි. ප්‍රමිති ක්‍රියාත්මක කරනු ලබන ආකාර 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) නිකිල හා අකිල මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු තම කාලය නිකරුනේ වැය නොකර කිසියම් ඵලදායී කාර්යයක නියැලීමටසිතා කළුතර ප්‍රදේශයේ තම නෑදෑ නිවසක සිට මැන්ගුස්ටින් පළතුර එක් රැස් කර අලෙවි කිරීමට කටයුතු කරන ලදී. පළතුරු වාරය අවසන් වූ කෙටි කාලයක් තුළ මෙම මිතුරන් දෙදෙනා නොසිතූ මුදල් ඉපයීමක් කරන ලදී. ඉන්පසු එම කටයුත්ත කෙටි කලකින් අවසන් කරන ලදී.

(අ) මෙම මිතුරන් දෙදෙනා ඇරඹූ ව්‍යාපාරය කුමක්ද? නම්කර එහි ලක්ෂණ දක්වන්න. (ලකුණු 2)

(ආ) ඉහත (අ) ප්‍රකාශයේ සඳහන් නිකිල අකිල දෙදෙනා ඇරඹූ ව්‍යාපාරය සාර්ථක වූ බැවින් ඔවුන් දෙදෙනා දිගුකාලීන මෙම ව්‍යාපාර කාර්යයේ නිරත වීමට සිතයි. මෙහිදී නීතිමය බැඳීම් අඩු ලියාපදිංචිය අනිවාර්ය නොවූ වගකීම් බෙදීමක් සිදුන්නාවූ ව්‍යාපාරයක් ඇරඹීම පිළිබඳ ඔබගෙන් උපදෙස් පතයි. ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? ඔබ යෝජනා කරන ව්‍යාපාරයේ යහපත් ලක්ෂණ ද ඔවුනට පැහැදිලි කර දෙන්න. (ලකුණු 2)

(v) පැතුම් කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරුවෙකි. ඔහු තම ව්‍යාපාරයට වඩා වරලත් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් අත්වන ප්‍රගතිය පිළිබඳ ඔබගෙන් විමසා සිටී.

(අ) වරලත් ව්‍යාපාරයක් පවත්වාගෙනයාමේ වාසි, අවාසි ඔහුට පැහැදිලි කර දෙන්න. (ලකුණු 2)

(ආ) වරලත් ව්‍යාපාරවල ලක්ෂණ අනුව එම ව්‍යාපාර වර්ග කර දක්වන්න. ඒවාට උදාහරණ 1 බැගින් දෙන්න. (ලකුණු 2)

03. (i) (අ) ඒක පුද්ගල හා හවුල් ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය නොවූවද අයිතිකරුවන් නමින් හැර වෙනත් නමකින් පවත්වාගන යයි නම් ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කල යුතුයි. ව්‍යාපාර නාම ආඥා පනත නම්කර, එම ව්‍යාපාර ලියාපදිංචි කරන අනුපිළිවෙල ද ලියා දක්වන්න. (ලකුණු 2)

(ආ) සමුපකාර ව්‍යාපාරයක් හා සංස්ථාපිත සමාගමක් අතර අසමානකම් 4ක් දක්වන්න. (ලකුණු 2)

(ii) (අ) ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

(ආ) ව්‍යවසායකත්වය බල ගැන්වීම සඳහා මූලික වශයෙන් කරුණු තුනක් එකිනෙක සම්බන්ධවීම අත්‍යාවශ්‍ය වේ. ඒවා මොනවාද? (ලකුණු 2)

(iii) ''ව්‍යවසායකයා සෑම විටම කළමනාකරුවෙකි. නමුත් කළමනාකරුවෙකු සෑම විටම ව්‍යවසායකයෙකු නොවිය හැක.'' කළමණාකරු හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් හතරක් සඳහන් කරන්න.(ලකුණු 4)

(iv) (අ) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල කාර්යයන් 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) කල් බදු මගින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට අත්වන වාසි 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) චෙක්පතක් අගරුවිය හැකි අවස්ථා 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

04. (i) ජීවිත රක්ෂණය හා ගිනි රක්ෂණය අතර පවතින වෙනස්කම් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) ආසන්නතම හේතුව මූලධර්මය රක්ෂණ වන්දි ගෙවීමේදී බලපානු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) සන්නිවේදන ක්‍රියාවලියට ප්‍රතිපෝෂණයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම 4ක් දක්වා පැහැදිලි කරන්න. (ලකුනු 2)

(අ) නිෂ්පාදකයින් බොහෝමයක් සිය නිෂ්පාදිත පාරිභෝගිකයා අතට පත් කිරීම සඳහා අතරමැදියන් යොදා ගනී. වෙළඳම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි 4ක් දක්වන්න. (ලකුණු 2)

(iv) (අ) නිදහස් වෙළඳමට බලපාන තීරු බදු නොවන බාධාවලට නිදසුන් 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) පහත සඳහන් භාණ්ඩ අපනයනය කිරීමේ දී අපනයන බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහන් කරන්න.

1. තේ
2. එළවලු, කුලු බඩු හා බුලත්
3. පොල්, කපාපු පොල්, පොල් කොල ආශ්‍රිත නිෂ්පාදන
4. මැණික් හා ස්වර්ණාභරණ (ලකුණු 2)

(v) වෙළෙඳ සංගම්, වෙලඳ ගිවිසුම්, හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළඳමට විවිධ වූ බලපෑම් ඇති කරන ආකාරය නිදසුන් 4ක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)

## II කොටස

05. (i) (අ) එක් එක් ආයතන වල කටයුතු පාලනය සඳහා කළමණාකරුවන් සිටින අතර, ඔවුනට නිශ්චිත වූ නිලනාමයක් නොමැත. ඔවුන් අධ්‍යක්ෂ, විධායක නිලධාරී, කොමසාරිස් ආදී නම් වලින් හඳුන්වයි. මෙලෙස ආයතනයක කළමනාකරුවන්විවිධ ආකාරයෙන් වර්ගවීම සඳහා උපයෝගී කරගනු ලබන පදනම් 3ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) හෙන්රි මින්ස් බර්ග්ට අනුව කළමණාකරණ භූමිකා හෙවත් කාර්යන් ප්‍රධාන ශීර්ෂ 3ක් යටතේ දක්වයි. එම ශීර්ෂ 3 දක්වා, එකිනෙකට අයත් කාර්යයන් 1 බැගින් දක්වන්න. (ලකුණු 2)

(ii) (අ) කළයුතු දෙය මනාව ඉටුකිරීම මගින් අපේක්ෂිත අරමුනු ඉටුකර ගැනීම කළමණාකරණයයි. කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට කළමණාකරුවෙකුට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ලකුණු 2)

(ආ) සැලැස්ම යන්න නිර්වචනය කර එය සැලසුම්කරණයෙන් වෙනස්වන ආකාරය දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ආයතනයක නායකත්වය මත එම ආයතනයේ සාර්ථකත්වය රඳා පවතී. පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) බලතල විමධ්‍යගතකරණය පැහැදිලි කර විමධ්‍යගත කිරීමේ වාසි දක්වන්න. (ලකුණු 2)

(iv) පිරීයත සැලැස්මක් යනු කුමක්දැයි හඳුන්වන්න. පිරීයත සැලැස්මක වාසි ලියන්න. (ලකුණු 4)

(v) (අ) මෙහෙයුම් කළමණාකරණයේ තත්ව පාලනය හා තත්ව ආරක්ෂණය යන සංකල්ප දෙක පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) මෙහෙයුම් කළමණාකරණයට අයත් මූලික කාර්යන් හා ඒවාට අයත් අනුබද්ධ කාර්යන් දක්වන්න. (ලකුණු 2)

06. (i) නිෂ්පාදන කළමණාකරණයේ වැදගත් අංගයක් ලෙස නඩත්තු කිරීම දැක්විය හැක. පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) නිෂ්පාදන ආයතනයක් තුළ ක්‍රමානුකූලව නඩත්තුවක් සිදුකරයි නම් ඉන් ආයතනයට ලබාගත හැකි ප්‍රතිලාභ 4ක් දක්වන්න. (ලකුනු 2)

(ආ) නිෂ්පාදන ආයතනයක් තම නිෂ්පාදනයට ගනුලබන අමුද්‍රව්‍ය නශ්‍යවන සුළු ඒවානම් එම ආයතනයට ගැළපෙන තොග පාලන ක්‍රමය නම් කර එහි වාසි අවාසි 2 බැගින් ලියන්න. (ලකුණු 2)

(iii) (අ) නිෂ්පාදනය හා නිෂ්පාදන කළමනාකරණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) පහත දැක්වෙන්නේ නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය සමූහයකි. ඒවා ස්ථාවර හා විචල්‍ය පිරිවැයට වර්ග කරන්න.

| | | |
|---|---|---|
| 1. ඍජු ද්‍රව්‍ය පිරිවැය | 2. කැලි වැටුප් | 3. ඍජු ශ්‍රම පිරිවැය |
| 4. ගෙවල් කුලී | 5. ස්ථිර සේවක වැටුප් | |
| 6. විකුණුම් සඳහා ලබාදෙන කොමිස් | 7. ගොඩනැගිලි ක්ෂය | |

(ලකුණු 2)

(iv) (අ) අලෙවිකරණය හා අලෙවිය අතර වෙනස්කම් හතරක් දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයක් තම අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කළයුතු මූලික ප්‍රවේශයන් අලෙවිකරණ සංකල්ප ලෙස හැඳින්වේ. අලෙවිකරණ සංකල්ප 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) වෙළඳපොළ ඛණ්ඩනය සඳහා උපයෝගී කරගනු ලබන නිර්ණායකයන් හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) 'සෑම වෙළඳපොළ ඛණ්ඩනයක්ම සඵලදායී නොවේ' සඵලදායී වෙළඳපොළ ඛණ්ඩනයක් සඳහා පැවතිය යුතු අවශ්‍යතා විස්තර කරන්න. (ලකුණු 2)

07. (i) අලෙවිකරණයේ ජයග්‍රහණය වන්නේ යම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ වෙළඳ පොළෙහිඉතා හොඳින් ස්ථාපිත වීමයි.

(අ) වෙළඳ පොළෙහි ස්ථාපිතවීම (Market Positioning) යනු කුමක්ද? (ලකුණු 2)

(ආ) වෙළෙඳපොළෙහි ස්ථාපිතවිය හැකි ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) ආයතනයක 'නිෂ්පාදිත මිශ්‍රය' යනුකුමක්දැයි පැහැදිලි කර එහි දිග, පළල, ගැඹුර හා සංගතභාවය උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) නිෂ්පාදිතයක් සඳහා පාරිභෝගික වටිනාකමේ ධූරාවලිය (නිෂ්පාදිත මට්ටම්) නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(iv) (අ) මූල්‍ය කළමණාකරණයයනු කුමක්දැයි අර්ථකථනය කරන්න. (ලකුණු 2)

(ආ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්ය කවරේද? (ලකුණු 2)

(v) සඵලදායී ලෙස අරමුදල් සම්පාදනය කර ගැනීමත්ඒවා භාවිතා කිරීමත් මූල්‍ය කළමණාකරුගේ මූලික වගකීම වේ.

(අ) මූල්‍ය කළමනාකරුගේකාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයකට අරමුදල් සම්පාදනය කරගත හැකි අභ්‍යන්තර හා බාහිර මූල්‍ය සම්පාදන මාර්ග සඳහා නිදසුන් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

08. (i) (අ) ක්‍රියාකාරී අනුපාත/මෙහෙයුම් කාර්යක්‍ෂමතා අනුපාත යනු මොනවාදැයි පැහැදිලි කරන්න.(ලකුණු 2)

(ආ) සීමාසහිත සමාගමක තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2019.1.1 | බඩු තොගය | රු. 80000 |
| 2019 | වර්ෂයේ ගැණුම් | රු. 60000 |
| 2019.12.31 | බඩුතොගය | රු. 30000 |

2019 වර්ෂයේ සමාගමේ තොග පිරිවැටුම් අනුපාතය ගණනය කරන්න. (ලකුණු 2)

(ii) (අ) සීමිත පොදු සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචිවිය හැකි ආකාර තුනකි. ඒ මොනවාද? (ලකුනු 2)

(ආ) කොළඹ කොටස් හුවමාරුවේ සමාගම් ලැයිස්තුගත කිරීමේදී භාවිතාවන පුවරු මොනවාද නම්කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) සීමාසහිත කළණ හා මිතුරු සමාගම් දෙකෙහි මූල්‍ය තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | **කළණ** | **මිතුරු** |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රාග්ධන ආයෝජන | 300,000 | 120,000 |
| විකුණුම් | 600,000 | 360,000 |
| ශුද්ධ ලාභය | 60,000 | 40,000 |

ඉහත කළණ හා මිතුරු සමාගම් දෙකෙහි ලාභදායිත්ව අනුපාත ගණනය කර වඩාත් සාර්ථක සමාගම කුමක්දැයි පෙන්වන්න. (ලකුණු 4)

(iv) (අ) මානව සම්පත් සැලසුම්කරණය හඳුන්වන්න. (ලකුණු 2)

(ආ) මානව සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියක පියවර පිළිවෙළින් දක්වන්න. (ලකුණු 2)

(v) සේවක ආකර්ෂණ ක්‍රියාවලියෙහි පියවරයන් පිළිවෙළින් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 4)